පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 06 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂයය :- පෙරදිග සංගීතය I , II

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................

කාලය : පැය 2 යි.

## I පත්‍රය

✪ 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) සරිගම, රිගමප .................. යන ස්වර අභ්‍යාසයේ මීළගට යෙදිය යුතු ස්වර ඛණ්ඩය වන්නේ,

1. මපධනි 2. පධනිස් 3. ගමපධ 4. ධනිස්නි

(2) ස්වර ස්ථාපන ගීතයක් **නොවන්නේ** මින් කුමක් ද?

1. බැතිනා සිරිපා කරුණා කරනා
2. කඳුපෙළ අතරේ තුරු වදුලේ
3. දිය ගොඩ සැමතැන කිරි ඉතිරේ
4. කඳු කඳු නැගෙනා වෙරළේ හැපෙනා

(3) | × – × | × × × | × × × | × × – | මෙම රිද්ම රටාව බෙදෙන්නේ ?

1. මාත්‍රා දෙකෙන් දෙකට ය.
2. මාත්‍රා තුනෙන් තුනට ය.
3. මාත්‍රා හතරෙන් හතරට ය.
4. මාත්‍රා හයෙන් හයට ය.

(4) ''මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ'' ............ යනුවෙන් ආරම්භ වන්නේ,

1. චිත්‍රපට ගීතයකි.
2. සරල ගීතයකි.
3. ළමා ගීතයකි.
4. නූර්ති ගීතයකි.

(5) ''විල්පත්තුව''යන වචනයට හිමි ලඝු මාත්‍රා සහ ගුරු මාත්‍රා සංඛ්‍යාව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ මින් කුමක් ද?

1. දෙකයි, දෙකයි 2. දෙකයි, හතරයි 3. හතරයි, දෙකයි 4. දෙකයි, තුනයි

✪ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර, පහත දැක්වෙන පින්තූර උපයෝගි කර ගනිමින් ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.


A


B


C


D


E

(6) පෙරදිග හා අපරදිග සංගීත සම්ප්‍රදායන් දෙකෙහිම භාවිතා වන තත්වාද්‍ය භාණ්ඩයකි. ........................................................

(7) ශුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් සංගීත භාණ්ඩයකි. ..............................................................................................

(8) උතුරු ඉන්දීය සංගීත සම්ප්‍රදායට අයත් මිශ්‍රාබයක ආධාරයෙන් වයනු ලබන ස්වර වාද්‍ය භාණ්ඩයකි. ..............................

(9) අමීර් කුෂ්රු නමැති සංගීතඥයා විසින් නිර්මාණය කරන ලද අවනද්ධ වාද්‍ය භාණ්ඩයකි. .............................................

(10) පෙරදිග සංගීත සම්ප්‍රදායට අයත්, වර්තමානයේ ඉතා ජනප්‍රිය තත් වාද්‍ය භාණ්ඩයකි. ........................................................

✪ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා A තීරුවේ ඇති ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (11) | සාර සදිසිපෙති පේර නෙළන කල | ස්වර ස්ථාපන ගීතයකි. |
| (12) | ස්වර පුවරු සංගීත භාණ්ඩයකි. | දඬු බෙරය. |
| (13) | පෙරයම බුද්ධං සරණේ යන ගීතය | මේවර කෙළියේ ගීතයකි. |
| (14) | "හොඳ දේ හිතමී" යන ගීතය | මෙලෝඩිකාව |
| (15) | ආදේශක භාණ්ඩයකි. | තුන් සරණේ ගීතයකි. |

✪ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති වගන්ති හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.

(16) නරි බැණා නාට්‍යයේ ඇතැම් ගීත රබන් පද ඇසුරෙන් නිර්මාණය වී ඇත. ( )

(17) "සුරතල් නංගියේ අපෙ අම්මා" යන ගීතය උපදේශාත්මක ගීතයකි. ( )

(18) "සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන" ගීතයේ සංගීත නිර්මාණය කරන ලද්දේ, අමරා රණතුංග මහත්මිය විසිනි. ( )

(19) ජන ගණ මන අධි නායක ජයහේ ……… යනු ඉන්දුනීසියාවේ ජාතික ගීයයි. ( )

(20) බටනලාවේ සිදුරු සියල්ල වසා පිඹින විට නිකුත් වන්නේ "ප" ස්වර යයි. ( )

---

# II පත්‍රය

✪ තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1)

i. පහත සඳහන් වගුවෙහි නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න. (ලකුණු 06)

| පෙරදිග ස්වර සංකේත | පෙරදිග ස්වර නාම | අපරදිග ස්වර සංකේත | අපරදිග ස්වර නාම |
|---|---|---|---|
| ස | සඩ්ජය | | Do |
| රි | | D | |
| ග | ගාන්ධාර | | |
| ම | | F | |
| ප | පංචමය | | So |
| ධ | | | La |
| නි | | B | |

ii. ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(2)

i. ඔබ දන්නා සුළඟේ ආධාරයෙන් වයන භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන් එකක දළ රූප සටහනක් ඇඳ, එම භාණ්ඩය පිළිබඳව කරුණු දෙකක් ලියන්න. (ලකුණු 06)

iii. පහත සඳහන් ස්වර අභ්‍යාසයේ හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

සරිග ……………. ……………. ……………. ……………. ධනිසා

(3) ''ඇහැළ මලින් ගස් පිරිලා - බලන්න හරි ලස්සනයි''

i. මෙම ගීතය ඇතුළත් නාට්‍ය නම් කරන්න. (ලකුණු 02)

ii. එම නාට්‍යයෙහි නිෂ්පාදකවරයා නම් කරන්න. (ලකුණු 02)

iii. එම නාට්‍යයෙහි සංගීත අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ලකුණු 02)

iv. එම නාට්‍යයෙහි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

iv. ඉහත දක්වන ලද ගීතය සම්පූර්ණයෙන් ලියා දක්වන්න. (ලකුණු 04)

(4)

i. ලඝු, ගුරු, ප්ලුත, මාත්‍රා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06)

ii. පහත දැකවෙන ගී පාදවල ලඝු මාත්‍රා සහ ගුරු මාත්‍රා ගණන වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 06)

a. බැතිනා සිරිපා කරුණා කරනා

b. සුරතල් නංගියෙ අපෙ අම්මා

c. සාර සදිසි පෙති පේර නෙළන කල

(5)

i. ''සුවඳ පත්ම ඕලු ආදි'' යන ගීතය ඇතුළත් නූර්ති නාට්‍යයෙහි නම කුමක් ද? (ලකුණු 02)

ii. එම නාට්‍යයෙහි නිෂ්පාදකවරයා නම් කරන්න. (ලකුණු 02)

iii. නූර්ති නාට්‍ය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

iii. ඉහත දැක්වෙන නූර්ති ගීතයෙහි පදමාලාව සම්පූර්ණයෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(6)

i. තුන් සරණේ ගීත පිළිබඳව ඔබ දන්නා කරුණු තුනක් ලියන්න. (ලකුණු 06)

ii. ඔබ උගත් තුන් සරණේ ගීතයක් ලියා දක්වන්න. (ලකුණු 06)

(7)

i. පහත දී ඇති ගීත පාදයන් නිවැරදි මාත්‍රා ගණන් අනුව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

a. කිරි සුදු හාවා - පැන පැන ආවා

b. ලංකා ලංකා පෙම්බර ලංකා

c. සුවඳ පත්ම ඕලු ආදි

ii. ඔබ උගත් ළමා ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 06)